# ථේරවාදී පිටක ග්‍රන්ථාගත ධර්මකාය සංවර්ණනාව

*ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කහංගමුවේ රාහුල හිමි (ගෞරව ශාස්ත්‍රවේදී, දර්ශනපති) බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර*

බුදුන් වහන්සේ අවබෝධකරගත් ධර්මයේ තරම බුදු කෙනෙකුන් ම විනා වෙනත් අයෙකුගේ වර්ණනාවෙන් නිම කර ගත නොහැකි ය. බුදුන් වහන්සේ ආමන්ත්‍රණය කිරීමටත්, ධර්ම රත්නයේ ගුණ විශේෂ හැඳින්වීමටත් යෙදෙන ගුණවාචී පදයන්ගෙන් එහි විශිෂ්ඨතාව අවබෝධකර ගැනීමට පුළුවන. දැනගත යුතු සියලු ධර්මතාවන් ගුරුවරයෙකු නො මැතිව බුදුන් වහන්සේ අවබෝධ කරගත් සේක. බුදුබවට ගුරුවරයකු නො වූවත් බුදුවීමෙන් අනතුරුව තමන් අවබෝධකර ගත් ධර්මය ගුරුතන්හි තබාගැනීමෙන් එහි සුවිශේෂී ගුණය පැහැදිලි වේ. බුදුන් වහන්සේ තමන් අවබෝධ කරගෙන දේශනා කර වදාළ ඒ උතුම් ශ්‍රී සද්ධර්මය අනුගමනය කරමින් නිවන්ඵල ලබා ගැනීම ධර්මයේ මූලික ආධ්‍යාශය යි. එය බුදුවරයන්ගේ ද අනුශාසනා ව යි. විශේෂයෙන් පාලි පිටක ග්‍රන්ථ කීපයක ම ඒ සද්ධර්මයේ සුවිශේෂීතාව පැහැදිලි අර්ථකථන අන්තර්ගතයෙන් දැක ගැනීමට පුළුවන.

තථාගත යන පර්යාය පදයෙන් බුදුන් වහන්සේ ඇමතීමෙහි එහි අන්තර්ගත සුවිශේෂී ගුණයන් පිළිබඳ අංගුත්තර නිකායෙහි මෙසේ සඳහන් වේ.

> "මහණෙනි, තථාගතයන්වහන්සේ ලෝකය අවබෝධ කළ හ. ලෝකයෙන් වෙන් වූහ. ලෝක සමුදය අවබෝධ කළහ. ලෝක සමුදය ප්‍රහීණ කළ හ. ලෝක නිරෝධ ගාමිණී පටිපදාව අවබෝධ කළ හ. ලෝක නිරෝධ ගාමිණී පටිපදාව දියුණු කළහ. දෙවියන්, මරුන්, බඹුන් සහිත ලෝකයේ ශ්‍රමණ බ්‍රාහ්මණයන් දෙව් මිනිසුන් විසින් දකින ලද, අසන ලද පසස්නා ලද, සොයන ලද, සිත් ලුහු බඳනා ලද යමක් ඇත්නම් ඒ සියල්ල තථාගතයන් වහන්සේ විසින් අවබෝධ කරන ලදි. එබැවින් තථාගත කියා කියනු ලැබේ."[1]

බුදුන් වහන්සේගේ මේ ප්‍රකාශයෙන් ම අපට පැහැදිලි වන්නේ උන්වහන්සේ සියලු දෙය තත්වාකාරයෙන් අවබෝධ කරගත් බව යි. හේතුඵලවාදී දහමට අනුගත ව චතුරාර්ය සත්‍යය අවබෝධ කරගත් නිසා උන්වහන්සේ තථාගත වන සේක. එම ධර්මය ලොවෙහි සියලු දෙනාට, විශ්වයේ සියලු දෙනාට හිතසුව පිණිස පවත්නා වෙයි. සියලු දෙනාගේ අවසන් අභිමතාර්ථ සාධනය පිණිස ඒ දහම උපකාරී වේ.

ඒ සද්ධර්මය පහසුවෙන් අවබෝධ කර ගත්තක් නො වේ. පහසුවෙන් දැකිය නො හැකිය. දුකසේ ම අවබෝධ කරගත යුතු ය.

''අත්ථි භික්ඛවෙ අඤ්ඤොාව ධම්මා ගම්භීරා දුද්දසා දුරනුබොධා සන්තා පණීතා අතක්කාවචරා නිපුණා පණ්ඩිත වෙදනීයා......''[2]

පොළොව දරා සිටින්නා වූ ජලය මෙන් ඒ ධර්මය ගැඹුරු ය. ගැඹුරු සෙයින් ම පර්වතයකින් වසා තබන ලද්දක් මෙන් දුක්සේ දැකිය යුතු ය. දුක සේ දැකිය යුතු හෙයින් ම දුකසේ අවබෝධ කරගත යුතු ය. ශාන්තය, ප්‍රණීතය, තර්කයෙන් බැසගත නො හැක්කකි. සියුම් ය. මනා ව පිළිපන් නුවනැත්තන් විසින් ම ඥානයෙන් දැනගත යුත්තේ යැයි බුදුන් වහන්සේ ම තම අවබෝධ ධර්මයේ ගාම්භීරත්වය ප්‍රකාශ කරති. සංසාර විමුක්තිය උදාකර දෙන එම ධර්මය අවබෝධකර ගත යුත්තේ ඉතා අමාරුවෙන් ය. දුකසේ වුව ද අවබෝධ කර ගතහොත් එහි ප්‍රතිඵලය විපුල ය. සියල්ලෝ ඒ ධර්මය අවබෝධ කර ගැනීමෙහිලා සමත්හු නො වෙති. පණ්ඩිතයන් විසින් අතර්කයෙන් අවබෝධ කර ගනු ලැබිය යුතු ය. සියුම් විවේක බුද්ධියත් වීමංසක ඥානයත් ඇති තැනැත්තේ ඒ ධර්මයේ සුව විඳීමෙහි සමර්ථ වේ.

බුදුන් වහන්සේ අවබෝධ කරගත් ධර්මයේ සත්‍යතාව පිළිබඳ ව උන්වහන්සේට සකාරණ ව දොස් නැඟීමට කිසිවෙකු විශ්වයේ නැත. එබැවින් ම උන් වහන්සේ විශාරද වූ ධර්ම ස්වභාවයට පත් වූ සේක. ඒ ධර්මය ලෝක සත්වයාගේ විමුක්ති මාර්ගය පිණිස ම පවත්වන්නේය. සංයුක්ත නිකායේ පුප්ඵ සූත්‍රයේ දී බුදුන් වහන්සේ අවබෝධ කරගත් ධර්මය කවරක් උදෙසා ද යන්න මනා ව විවරණය කෙරෙයි.

''තථාගතයන් වහන්සේ යමක් මනාව අවබෝධ කරත්ද, මනාව දැන ගනිත් මනාව දැන අවබෝධකොට කියත් ද ? දේශනා කරත්



ද ? පනවත් ද ? පිහිටුවත් ද ? විවරණය කරත් ද ? විභජනය කරත් ද ? උඩුකුරු කරත් ද ? ......[3]

බුදුවරුන් ලොව පහළ වුව ද නැත ද ලොව පවත්නා වූ සත්‍යයක් වේ. එම සත්‍යය උඩු යටිකුරු කොට ලොවට ප්‍රකාශ කිරීම සඳහා බුදුවරු පහළ වෙත්. එය මනාව දැන ගැනීම අනෙක් සත්වයන්ගේ විමුක්ති මාර්ගය යි. ඒ සඳහා ඒ සත්වයන්ට වීමංසාව හා ප්‍රඥාව අවශ්‍ය බව එම සූත්‍ර පාඨයෙන් දැක් වේ. ලෝකය යැයි යමක් අමුතුවෙන් අවබෝධකර ගත යුතු නැති බවත්, තම පංච උපාදානස්ඛන්ධය පිළිබඳ මනා අවබෝධය ලබා ගැනීමත් බුද්ධ ධර්මයේ හරය බව පෙනේ. එය බුදුන් දැකීමෙහි මාර්ගය යි. හේතුඵලවාදී සිද්ධාන්ත මුල් කරගෙන තම පංච උපාදානස්ඛන්ධය ඇතිවීම, පැවතීම හා නැතිවීම පිළිබඳ ගැඹුරින් කියන බුදු වදන අවබෝධ කර ගැනීම බුදුසමයේ මූලික හරය වශයෙන් ගෙන තම විමුක්ති මාර්ගය සකසා ගත යුතු අයුරු එමගින් ධ්වනිත කෙරෙයි.

බුදුන් වහන්සේ ආමන්ත්‍රණය කිරීම සඳහා සංයුක්ත නිකායේ ඇතුළු වෙනත් තැන්වල විශේෂිත වූ ගුණවාචී පද කිහිපයක් ඇතුළත් වී ඇත. එම ගුණවාචී පදවලින් උන්වහන්සේ ආමන්ත්‍රණය කරන්නට හේතුව විවිධ වූ විෂය කෙරෙහි උන්වහන්සේ සතුව පැවති ගුණ විශේෂය බව ම අවිවාදයෙන් යුක්ත ව පිළිගත යුතුය. විටෙක දී එම ගුණ කථන බුදුන් වහන්සේ විසින් ම දේශනා කළ අතර තවත් තැනෙක දී ඒ ගුණවාචී පද බුද්ධ ශ්‍රාවකයන් විසින් ප්‍රකාශ කරන ලදී. අබෞද්ධ ජනතාවට පවා බුදුන් වහන්සේ දැක නිවන් දකින්නට මේ ගුණවාචී පද උපකාරී වී ඇති බව ඇතැම් තොරතුරු කථාවලින් පැහැදිලි වේ. මෙවැනි සුවිශේෂී වූ ගුණවාචී පදවලින් ආමන්ත්‍රණය ලැබූ වෙනත් එකදු සත්වයෙක් විශ්වයේ ම නැති තරම් ය. උන්වහන්සේ අග්‍රගණ්‍ය වූයේ අවබෝධකරගත් ධර්මයේ සුවිශේෂී තත්ත්වය නිසාය.

''භගවා අරහං සම්මා සම්බුද්ධො විජ්ජාචරණ සම්පන්නො සුගතො ලෝකවිදූ අනුත්තරො පුරිසදම්මසාරථී සත්ථා දේව මනුස්සානං බුද්ධො භගවා''[4]

මෙහි සඳහන් එක් එක් ගුණවාචී පද ත්‍රිපිටක ග්‍රන්ථවල විශේෂයෙන් ම සඳහන් කළ තැන දැක ගැනීමට පුළුවන. බුදුන් වහන්සේ විශ්වයේ අනෙක් සත්වයන් හා සම නො වන අයුරුත් උන්වහන්සේ ලොවට

463

හෙළි කළ ධර්මයේ සුවිශේෂිතාවනුත් එහි ඇතුළත් වන අයුරෙන් එම ගුණවාචී පද භාවිත කරගෙනඇත. ඒ එක් එක් ගුණවාචී පද ගෙන එහි ඇති සුවිශේෂී ලක්ෂණය කවරක් ද යන්න පිටක ග්‍රන්ථ ආශ්‍රයෙන් මෙහි දී විමසා බැලීම වැදගත් වනු ඇත.

''අරහං'' යනු බුදුසමයේ ඉගැන්වෙන මූලික නිෂ්ටාව යි. අනිත්‍ය දුක්ඛ අනාත්ම යැයි සංඛත ධර්මයන්ගේ මූලික අවබෝධය ලබාගෙන එහි නො ඇලී, එමගින් මිදී ලබන්නාවූ තත්ත්වය අර්හත්වයයි. බුදුන් වහන්සේ ධර්මාවබෝධයෙන් පසු ප්‍රථම ධර්ම දේශනය සඳහා බරණැස් නුවරට වඩින සේක් අතර මඟ දී හමු වූ උපක ආජීවකයාට තමා හඳුන්වා දෙන තැන තමා හැඳින්වීමට සුදුසු පදය වන්නේ ''අරහං'' යන්න බව බුදුන් වහන්සේගේ ම අදහස යි.

''අහං හි අරහා ලොකෙ''[5]

අරහත්වයට පත් වූ නිසා උන්වහන්සේට එසේ ආමන්ත්‍රණය කිරීම සුදුසු බව බුද්ධ භාෂිතය යි.

රූප, වේදනා ආදී ස්කන්ධයන්හි ඇතිවීම, පැවතීම හා නැවතීම තත් වූ පරිදි වටහා ගැනීම යතාභූතඥාණවාදය යනුවෙන් හැඳින්විය හැකි ය. ස්කන්ධාදීන්ගේ උපාදානත්වයෙන් මිදී ලබන තත්ත්වය අරහං වන බව බුදුන් වහන්සේ දේශනා කළ සේක.

> ''මහණෙනි, පංච උපාදාන ස්කන්ධවල ඇතිවීමත්, නැතිවීමත්, ආස්වාදයත්, ආදීනවයත්, නිස්සරණයත් තත් වූ පරිදි දැන, යම් භික්‍ෂුවක් ඒ උපාදාන රහිත ව මිදුනේ ද හේ අරහත්ය. භව බන්ධනය නිමා කළේය. මිදුනේය.''[6]

මමය මාගේය යනුවෙන් ගත යුතු දෙයක් නැති බැවින් එසේ දැඩිව අල්ලා ගැනීම දුකට හේතුව බවත් එය නැති කිරීම විමුක්තියට හේතුව බවත් එයින් පෙනේ. ආර්ය අෂ්ඨාංගික මාර්ගය අනුගමනය කරමින් සියලු කෙලෙස් නසා ලබන්නා වූ නිෂ්ඨාව අර්හත්වය වන බවත් එයින් පෙනේ. සියලු බැඳීම්වලින් විනිර්මුක්ත ව ලබන්නා වූ යථාභූතඥානවාදය ''අරහං'' යනුවෙන් අර්ථ විග්‍රහ වූ ආකාරය තථාගතයන් වහන්සේ දේශනා කළ සේක. භවක්ඛන්ධය දුරු කොට ලබන්නා වූ ප්‍රණීතත්වය ම ශාන්ත



තත්ත්වය ම ''අරහං'' වන්නේය. නැත්නම් බුදු දහමේ මූලික නිෂ්ඨාව ''අරහං'' වන බව මේ ප්‍රකාශවලින් මොනවට ප්‍රකාශ වන්නේ ද ?

බුදුන් වහන්සේ සඳහා යොදනු ලබන තවත් පර්යාය පදයකි ''සම්මා සම්බුද්ධෝ'' චතුරාර්ය සත්‍යය තත් වූ පරිද්දෙන් අවබෝධ කරගත් බැවින් තථාගතයන් වහන්සේ ''සම්මා සම්බුද්ධ'' නම් වන සේක. උපක ආජීවකයාට බුදුන් වහන්සේ දේශනා කළේ සම්මා සම්බුදුවරුන් දෙදෙනකු ලොව එකවර පහළ නො වන නිසා තමා එක ම සම්මා සම්බුද්ධ වන බව යි.

''එකොම්හි සම්මා සම්බුද්ධො''[7]

චතුරාර්ය සත්‍ය ධර්මතාව නො දැනීම නිසා සත්වයා සසර සැරිසරණ බවත්, එය අවබෝධ කර ගැනීමෙන් තමන් සම්මා සම්බුද්ධ වන බවත් බුදුන් වහන්සේ නොයෙක් විට තම ශ්‍රාවකයන්ට දේශනා කොට වදාළ සේක. උන්වහන්සේ ධම්මචක්කපවත්තන සූත්‍රයේ දී දේශනා කළේ ද එයයි.

> ''යම්තාක් කල් මට මේ චතුසත්‍ය ධර්මයන්හි පරිවෘත්ත තුනක් ඇති දොළොස් ආකාර ඇති, ඥාන දර්ශනය තත් වූ පරිද්දෙන් පිරිසිදු නො වී ද ඒ තාක් කල් මම දෙවියන් මරුන් බඹුන් සහිත ලොව මහණ බමුණන් දෙව් මිනිසුන් සහිත ප්‍රජාවෙහි අනුත්තර සම්‍යක් සම්බෝධිය අවබෝධ කළෙමි කියා ප්‍රකාශ නො කළෙමි.''[8]

චතුරාර්ය සත්‍යය තත් වූ පරිද්දෙන් අවබෝධ කරගත් බැවින් උන්වහන්සේ සම්මා සම්බුද්ධ නම් වන බව උන්වහන්සේගේ ප්‍රකාශයෙන් ම අවබෝධ කරගත හැකි ය.

බුදුන් වහන්සේගේ ප්‍රඥාවත් එයට ගැළපෙන චරණයත් හැඳින්වීම පිණිස ''විජ්ජාචරණ සම්පන්නො'' යන ගුණවාචී පදය භාවිත කරයි. පසළොස් චරණ ධර්මයන්ගේ සුවිශේෂිතාව ප්‍රකට කරවීම් වස් මෙම ගුණවාචී පදයෙන් බුදුන් වහන්සේ ආමන්ත්‍රණය කරන්නේය. බුදුන් වහන්සේ සතුව පවත්නා විවිධ ඥානවල විජ්ජා යන පදයෙන් ද ඉන්ද්‍රිය සංවරාදී ශීල ගුණය චරණ යන පදයෙන් ද උපලක්ෂිත යි.

''සුගත'' යන පදයෙන් උන්වහන්සේ ආමන්ත්‍රණය කරන්නේ සුන්දර තැනට ගිය බැවිනි. එහි සුන්දර තැන නම් කවරයත් ? සංසාර ගමනෙහි අනන්ත දුක සැප දරා එහි තත් වූ පරිදි දැන එය නිවැරැදි මාර්ගය නො වන බව දැනගෙන කාමසුඛල්ලිකානු යෝගයත් අත්තකිලමතානු යෝගයත් ප්‍රතික්ෂේප කොට ප්‍රඥාව මෙහෙයවා මැදුම් පිළිවෙතට පිවිසියේ ශීල සමාධි ප්‍රඥා වඩා උතුම් නිර්වාණාවබෝධය අවබෝධ කරගත් සේක. එබැවින් උන්වහන්සේ ''සුගත'' නම් වන සේක. එමතුදු නොව නිවැරදි මාර්ගය දැන නිවැරදි මාර්ගය කියාදෙන බැවින් උන්වහන්සේ ''සුගත'' වන සේක.

ලෝකයේ නිවැරැදිතාව නිවැරැදි ව ම දැන ගැනීම ''ලෝකවිදූ'' යන පර්යාය පදයෙන් අභිප්‍රේත යි. ලෝකය පිළිබඳ වූ ගැඹුරු අවබෝධය ත්‍රි ලක්ෂණයට හසුකොට මෙන් ම ප්‍රතීත්‍යසමුත්පාද ධර්මයෙන් යුක්ත ව අවබෝධ කරගත් බැවින් බුදුන් වහන්සේ ''ලෝකවිදූ'' වන සේක. සංයුක්ත නිකායේ අන්තර්ගත ලෝක සූත්‍රයේ දී බුදුන් වහන්සේ ''ලෝකවිදූ'' වීමට බලපෑ කරුණු බුදුන් වහන්සේ ම දේශනා කරන්නේ මෙසේ යැ.

> ''මහණෙනි, ලෝකය හට ගැනීමත්, පැවතීම හා නැතිවීමත් දේශනා කරමි. ඒ ලෝකයේ හටගැනීම කුමක්ද ? ඇස රූපය නිසා චක්ඛු විඤ්ඤාණය පහළ වෙයි. එයින් මනෝ විඤ්ඤාණය පහළ වෙයි. ඒ කාරණාත්‍රයෙන් ස්පර්ශය පහළ වෙයි ..... ඒ තෘෂ්ණාවේ ම ශේෂ රහිත වූ විරාග නිරෝධයෙන් දුක් දොම්නස් නිරෝධ වෙයි. ඒ ලෝක නිරෝධය යි.''[9]

විශ්වය පිළිබඳ අවබෝධයත් පංචස්කන්ධය නැමති උපාදාන ලෝකයත් පිළිබඳ නිවැරැදි අවබෝධය බුදුන් වහන්සේ සතු වූ අයුරු එමගින් ධ්වනිත ය. ලෝකය යනුවෙන් සත්වයා තේමා කරගත් බුදුන් වහන්සේ සත්වයාගේ උපත, පැවැත් ම හා විනාශය පිළිබඳ ප්‍රතීත්‍ය සමුප්පාදයට අනුකූල ව බලා එයට නිවැරැදි විසඳුම් යෙදීම නිසා උන්වහන්සේ ලෝකවිදූ වන සේක. ලෝකය යනු තම ශරීර කූඩුව ම දැකීම සුදුසු බව බුදුන් වහන්සේගේ දේශනාවේ සඳහන් ය. ලෝකය ශූන්‍ය ලෙස දකින ලෙසත් එහි ගතයුතු දෙයක් නැති බවත් හේතුඵල ධර්මයට අනුව බුදුන් වහන්සේ දේශනා කළ සේක. ලෝකය පිළිබඳ ව දෙවි බඹුන් සහිත ලෝකය යමක් දක්නා ලදද, අසන ලදද, යමක් පිළිබඳ ව ප්‍රශංසා කරන ලදද, යමක් ලබන ලදිද, සොයන ලදිද, තථාගතයන් වහන්සේ ඒ සියල්ලෙහි යථාරූපය තත් වූ පරිද්දෙන් අවබෝධ කරගත් සේක. එබැවින් උන්වහන්සේ ලෝකවිදූ වූ සේක.



දමනය කටයුතු සත්වයන් දමනය කිරීමේ ගුණයෙන් පරිපෝෂිත බැවින් බුදුන් වහන්සේ ''පුරිසදම්මසාරථී'' නම් වන සේක. කුසලය හා අකුසලය යනු කවරක්දැයි පෙන්වා දෙමින් ශීල, සමාධි, ප්‍රඥා, මාර්ගයෙන් සත්වයන්ට හිතානුකම්පී වීමෙහිලා විෂම සතුන් පවා බුදුන් වහන්සේගේ බුදු ඇසට ගෝචර විය. එහි දී උන්වහන්සේ දේශනා මාර්ගයෙන්, සාකච්ඡා මාර්ගයෙන් හා සෘද්ධි ප්‍රාතිහාර්ය මාර්ගයෙන් ඔවුනට විමුක්ති මාර්ගය ලබා දුන් හ.

බුදුන් වහන්සේගේ ''සත්ථා දේවමනුස්සානං'' යන ගුණයෙන් ශාස්තෘත්වයේ අගය පෙන්වා දෙයි. සියලු සත්වයන්ට ආර්ය වීමත්, අනුශාසකත්වය දැක්වීමත් ගුරු මුෂ්ටි නො තබා ධර්මය දේශනා කිරීමත් යන කාරණා නිසා සියලු සතුන්ගේ නිවැරැදි ගුරුවරයා බුදුන් වහන්සේ වන්නේය. බුදුන් වහන්සේගේ තත් අනුශාසනාවේ හරය ඛුද්දක නිකායේ එක් ගාථා පාඨයකින් මෙසේ නිරූපිත කොට ඇත.

> ''සබ්බ පාපස්ස අකරණං - කුසලස්ස උපසම්පදා
> සචිත්ත පරියොදපනං - එතං බුද්ධානසාසනං''[10]

සියලු පව් නො කිරීම, එමෙන් ම සියලු කුසල් රැස්කිරීම හා තමන්ගේ සිත පවිත්‍ර කර ගැනීම යන මෙය බුදුවරයන් වහන්සේලාගේ අනුශාසනා වයි.

ආදර්ශයෙන් අනුශාසකත්වයට පත්වීම බුදුන් වහන්සේගේ ඒ සුවිශේෂී ගුණ ලක්ෂණය යි. තමන් වහන්සේ පළමු ව විශුද්ධිය ලබාගෙන දෙවනු ව අනුන්ගේ විශුද්ධිය පිණිස නිවැරැදි ශාස්තෘත්වය ප්‍රකට කළ බැවින් උන්වහන්සේ ''සත්තා දේවමනුස්සානං'' වූ සේක.

කෙනෙකුගේ උපදේශ රහිත ව හුදකලා ව තමන් ම තම ජීවිත පරිත්‍යාගයෙන් සාරා සංඛෙය්‍ය කල්ප ලක්ෂයක් ආත්ම පුරාවට පර්යේෂණ පවත්වා සත්‍යාවබෝධය ලබාගත් බැවින් බුදුන් වහන්සේට ''බුද්ධ'' ''සම්බුද්ධ'' ''අභිසම්බුද්ධ' ''සම්මා සම්බුද්ධ'' යන පර්යාය පදයන් භාවිත කරන්නේ ද ඒ අර්ථයෙන් ම ය. බුදුන් වහන්සේ ද්‍රෝණ නම් බ්‍රාහ්මණයෙකු සමග කළ සාකච්ඡාවේ දී තමන් හැඳින්වීමට සුදුසු ම නම වශයෙන් බුදුන් වහන්සේ සඳහන් කළේ ''බුද්ධ'' යන වචනය යි. එමගින් බුදුන් වහන්සේ එම බමුණාට ඒත්තු ගන්වන්නට උත්සාහ කළේ තමන් පෘථග්ජන

සතුන් අතර ඉපිද එහි වැඩී එයින් වෙන් ව උතුම් වූ සම්බෝධියට පත් වූ බව යි. පෘථග්ජන සතුන් අතර පවත්නා සියලු ආශ්‍රව ධර්ම තමන් ප්‍රහීණ කළ බැවින් දෙවියන්, බඹුන් ලෙස තමන් වහන්සේ ආමන්ත්‍රණය නො කළ යුතු බව බුදුන් වහන්සේගේ අදහස යි.

> ''බමුණා, යම් ආශ්‍රව නො නැසීම නිසා දෙවියෙකු වෙයි නම් යක්ෂයෙකු වෙයි නම්, මනුෂ්‍යයෙකු වෙයි නම් ඒ ආශ්‍රව මා විසින් ප්‍රහීණ කරන ලදී. මතු නූපදින සේ අභාවගත කරන ලදී. උපුල් මලක් හෝ රතු පියුමක් හෝ සුදු පියුමක් දියෙහි ඉපදී දියෙහි වැඩී දියෙන් උඩ නැගී දියෙහි නො තැවරී පවතින්නාක් මෙන් මම ලොව ඉපිද ලොව වැඩී ලොව මැඩගෙන ලොවින් උඩ නැගී ලෝකය සමග නො ගැටී වාසය කරමි. එබැවින් මා ඇමතීමට සුදුසු පදය වන්නේ ''බුද්ධ'' යනු යි.''[11]

මෙයින් පෙනෙන්නේ දෙවියකු, මිනිසකු, ගාන්ධර්වයකු, යක්ෂයකු හා බ්‍රහ්මයකු වීම සඳහා යම් ආශ්‍රව ධර්මයක් ශේෂ ව පැවතිය යුතු බව යි. එහෙත් ඒ ආශ්‍රව ධර්ම ඉතිරි ව ඉපිද එයින් ශේෂ නො වන ආශ්‍රව ධර්ම ඇති තැනට පත් වන්නේ නම් ඒ සම්මා සම්බුද්ධ තත්ත්වයට පත්වීමකි. පෘථග්ජන ලෝකය පිළිබඳ මනා අවබෝධයක් එයින් විනිර්මුක්ත වීමේ මඟත් මනා ව දත් බැවිනුත් එය ම පිළිගත් බැවිනුත්, එයින් සත්වයන්ට ම අනුශාසනා කොට විශුද්ධත්වයට පත් කළ බැවිනුත් බුදුන් වහන්සේ ''බුද්ධ'' නම් වන සේක.

සියලු කෙලෙසුන් බිඳ දැමීම නිසා ද, ගරුකටයුතු බැවින් ද, භාග්‍යවන්ත බැවින් ද, බුදුන් වහන්සේ හා සම කළ හැකි කිසිවකු විශ්වයේ නැති බැවින් ද බුදුන් වහන්සේට ''භගවා'' යන ගුණවාචී පදය භාවිත කෙරේ. ත්‍රිපිටකයේ වැඩි වාර ගණනකින් බුදුන් වහන්සේ ''භගවා'' යන අර්ථයෙන් හඳුන්වා ඇත. රූපකාය සම්පත්තිය අතින් ද ධර්මකාය සම්පත්තියෙන් ද විශේෂිත වූ බැවින් බුදුන් වහන්සේ ''භගවා'' නම් වන්නේය.

ඉහත දැක්වූ ගුණවාචී පද විස්තරයෙන් අපට පැහැදිලි ව පෙනෙන්නේ බුදුන් වහන්සේගේ ධර්මකාය සම්පත්තියේ සුවිශේෂි හේතූන් නිසා ඒ නම්වලින් උන්වහන්සේ ආමන්ත්‍රණය කළ බව යි. සුවිශේෂිත ධර්මකාය සම්පත්තියකින් බුදුන් වහන්සේ අසමසම වූවා පමණක් නො ව එම



ධර්මය දේශනා කිරීමේ දී ද අනෙක් ශාස්තෘවරුන් නො ගත් මග ඔස්සේ තම ධර්ම ඥානය පතුරුවා ලීමෙහි විශිෂ්ට වූ හ. ධර්ම රත්නයේ ගුණ ගැයෙන තැනෙක්හි දී බුදුන් වහන්සේගේ සව්වන් විවිධ අංශවලින් තත් ගුණ ගායනා කොට ඇති බව පෙනේ. උන්වහන්සේ අවබෝධකරගත් ධර්මය සියල්ල සව්වන්ට දේශනා කළේ නැත. ඇට්ටේරියා වනයෙහි උපමාවකින් බුදුන් වහන්සේ තම ශ්‍රාවකයන්ට පැහැදිලි කර දුන්නේ සංසාර ගමන නතර කරවීමට අවශ්‍ය දහම් පමණක් ශ්‍රාවකයාට දේශනා කළ බව යි.

තමා විසින් ම ලෝකයේ යථා ස්වරූපය අවබෝධ කරගත් උන්වහන්සේ එය අන්‍යයන්ට පහදා දුන්නේ නිවන් මාර්ගය උදෙසා ය. දීඝනිකායේ සීහනාද සූත්‍රයේ දී බුදුන් වහන්සේ දේශනා කරන්නේ භාග්‍යවත්තෙම ලෝකයේ පහළ වී ධර්මය දේශනා කරන්නේ එය කවරාකාර කෙනෙක් වුව ද මනා ව ග්‍රහණය කර ගන්නේ නම් ඔහුට සංසාර විමුක්තිය ලැබෙන බව යි. යමෙක් බුදුන් දකිනවා යනු ධර්මය දැකීම යි. නැතිනම් පටිච්ච සමුප්පාද ධර්මය අවබෝධ කර ගැනීම යි. ධර්මයෙන් තොර බුදුන් දැකීමක් නැත. බුදුන් වහන්සේ පිරිනිවන් මංචකයේ වැඩ සිටිද්දී එක්තරා භික්ෂු නමක් රහත්වීමට ගත් උත්සාහය පසසා බුදුන් වහන්සේ දේශනා කර සිටියේ ද එය යි.

උන්වහන්සේ අවබෝධ කරගත් ධර්මය දේශනා කරන විට මේ බණ කියන්නේ මට යැයි නො සිතපු කෙනෙක් ඒ දම්සභා මණ්ඩපයෙහි නො වූ හ. සෑම සත්වයෙකුගේ ම මනසට ගෝචර වන අයුරෙන් ධර්මය දේශනා කිරීම උන්වහන්සේගේ දේශනා විලාසයෙහි සුවිශේෂී ලක්ෂණය යි. ඒ ධර්මය අසන සත්වයෙකුගේ මුවින් පිටවෙන්නා වූ ප්‍රීති වාක්‍ය දෙස බැලීමෙන් තත් ධර්මයේ සුවිශේෂිතාව ප්‍රකට කරව යි. සූත්‍ර පිටකයේ සඳහන් සූත්‍ර ගණනාවක ම එක ම උදාන වාක්‍යයක් දැක ගැනීමට පුළුවන. එහි අන්තර්ගතයේ ඇත්තේ ඒ ශ්‍රී සද්ධර්මයේ විශේෂිත ගුණය යි. ධර්මාවබෝධයේ චිත්ත ප්‍රමුදිත භාවය යි.

> ''අභික්කන්තං භො ගොතම, අභික්කන්තං භො ගොතම, සෙය්‍යථාපි භො ගොතම නික්කුජ්ජිතංවා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූල්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය අන්ධකාරෙ වා තෙල පජ්ජොතං ධාරෙය්‍ය, චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති.....''[12]

''භාග්‍යවත් ගෞතමයන් වහන්ස, ඔබ වහන්සේගේ ධර්ම දේශනාව ඉතා යහපත. භවත් ගෞතමයන් වහන්ස, ඔබ වහන්සේගේ ධර්ම දේශනාව ඉතා යහපත, යටිකුරු කොට තිබූ භාජනයක් උඩුකුරු කොට තබන්නාක් මෙන්, යටපත් වූ නිධානයක් මතු කරන්නාක් මෙන්, මඟ මුලා වූවෙකුට මඟ කියන්නාක් මෙන් ඇස් ඇත්තෝ රූප දකිත්වා යි අන්ධකාරයෙහි තෙල් පිරූ විලක්කුවක් දරන්නාක් මෙන් ඔබ තුමන් විසින් නොයෙක් කරුණු ගෙනහැර දක්වමින් දහම් දෙසන ලදී. මම ඒ බුදුන් ද දහම් ද සඟුන් ද සරණ යමි.''

ධර්ම දේශනා විලාසයේ දී උන්වහන්සේ කාටත් වැටහෙන අනුපිළිවෙලින් ධර්මය දේශනා කළ හ. එපමණක් ද නොව තමන් අවබෝධකරගත් ධර්මය අන්‍යයන්ට අවබෝධ කරවීමෙහිලා උන්වහන්සේ ක්‍රම කීපයක් ම අනුගමනය කොට ඇත. ඒ අතර,

(i) අත්ථජ්ඣාසය - තම අදහසට අනුව ධර්මය දේශනා කිරීම.
(ii) පරජ්ඣාසය - අනුන්ගේ අදහසට අනුව ධර්මය දේශනා කිරීම.
(iii) අට්ඨුප්පත්තිකය - අර්ථකථන ක්‍රමයෙන් ධර්මය දේශනා කිරිම.
(iv) පුච්ඡාවසික - ප්‍රශ්න විචාරාත්මක ක්‍රමයට ධර්මය දේශනා කිරීම.

මෙම ක්‍රමවේදයට අමතරව බුදුන් වහන්සේ තමන් අවබෝධ කරගත් ධර්මය මාර්ගය පහදා දීමේ දී යොදාගත් ක්‍රම කීපයක් බෞද්ධ සාහිත්‍යාගත තොරතුරුවලින් අනාවරණය කර ගැනීමට පුළුවන. එනම්,

(i) ඒකංස ව්‍යාකරණී ක්‍රමය හෙවත් සෘජුව ම ප්‍රශ්නයට අදාළ පිළිතුරු සැපයීම.

(ii) පටිපුච්ඡා ව්‍යාකරණී ක්‍රමය හෙවත් ප්‍රශ්න උත්තර මාර්ගය.

(iii) විභජ්ජ ව්‍යාකරණී ක්‍රමය හෙවත් කොටස් වශයෙන් විස්තර කර පහදා දීම.

(iv) ඨපනීය ක්‍රමය හෙවත් පිළිතුරු නො දී සිටීමේ ක්‍රමය.[13]



මෙවැනි න්‍යාය තුළින් බුදුන් වහන්සේ තමන් අවබෝධ කරගත් ධර්මය සතුන්ගේ හිතසුව පිණිස දේශනා කිරීමට පසුබට නො වූහ.

තම ඉගැන්වීම් න්‍යාය තුළින් අසහාය චින්තන විප්ලවයක් ඇති කිරීමෙහිලා බුදුන් වහන්සේට මෙම ඉගැන්වීම ශිල්පීය ක්‍රම බෙහෙවින් උපකාරී විය. එමතු ද නො ව උන්වහන්සේ මාලුඞ්ක්‍ය පුත්ත තිස්ස තෙරුන් හා පැවති සාකච්ඡාවේ දී එක්තරා ප්‍රශ්න කීපයකට පිළිතුරු නො දීමට වගබලා ගත් හ. එවැනි ප්‍රශ්න ඨපනීය ප්‍රශ්න වශයෙන් තබා, පිළිතුරු දීමෙන් වැළකී සිටියේ එය පුද්ගලයාගේ විමුක්තිය පිණිස හේතු නො වන බැවිනි. ධර්මයේ අවබෝධය නම් නිවන් පිණිස ම පැවතීම යි. එයින් තොර ධර්මයක් අවබෝධ කර ගැනීම අනවශ්‍ය යැයි සිතූ විට ඒ භාග්‍යවතුන් වහන්සේ ධර්මය දේශනා කිරීමෙන් වැළකී සිටියේ එමඟින් සිදුවන්නා වූ අර්ථයක් නැති බැවිනි.

කොපමණ සත්‍ය වූ ධර්මයක් තමන් වහන්සේ අවබෝධ කර ගත් ද එය අන්‍යයන්ට බලහත්කාරයෙන් අවබෝධ කරවීමට උන්වහන්සේ උත්සුක නොවූ හ. කාලාමයන්ගේ ප්‍රකාශයෙන් ඒ බව තහවුරු වේ. ආත්මීය හේතු සම්බන්ධතාවන් පසෙක දමා යම් දෙයක් යහපත් යැයි, කුසල් යැයි ඔබට වැටහෙන්නේ නම් පමණක් පිළිපැදිය යුතු යනු බුද්ධ අනුශාසනා ව යි. මිනිසාගේ මානසික චින්තන නිදහස අගය කෙරූ, එසේ ම සත්‍යවාදී දහමක් දේශනා කළ බුදුන් වහන්සේ එය තමන්ගේ ආත්ම විමුක්තිය පිණිස යොදාගත යුතු බව නිරන්තර ව දේශනා කළ සේක. ධර්මය සසරින් එතෙරවීමට විනා පුද සත්කාර කිරීම සඳහා නොවන බව උන්වහන්සේගේ දේශනා වයි.

ධර්ම දේශනා විලාසයේ දී බුදුන් වහන්සේ අනුගමනය කළ කරුණුවලින් පැහැදිලි වන්නේ ධර්මය නිවන් මාර්ගය උදෙසා යොදාගත යුතු බව යි. එහෙත් බුදුන් වහන්සේ ධර්මය දේශනා කළේ අසන සියලු දෙනා ම නිවන් දකින නිසා හෝ නිවන් දක්වනු නිසා නො වේ. චරිතවත් සත්වයන් ඇතිකිරීමේ අටියෙනි.. සමානාත්මතාව අගය කරන පොදු හැඟීම්වලින් යුත් සිල්වත් ගුණවත් සමාජයක් බිහි කිරීම උන්වහන්සේගේ ධර්ම ප්‍රචාරයේ මූලික අරමුණ යි. ඒ ඒ පුද්ගලයාගේ මනසට විෂයවන අයුරෙන් නිදර්ශන හා උපමා කථා ගෙනහැර පාමින් ඔවුන්ගේ චරිතය පිරිසිදු කළ හ. රූප මදයෙන් ඔද්දල්ව ගිය ඛේමා තෙරණියට අදාළ චිත්තරූප සෘද්ධි බලයෙන් මවා පෙන්වා දුන්නාසේ ම, චුල්ල පන්ථක

තෙරුන්ට ප්‍රායෝගික වැඩමුළු ක්‍රමයකින් සත්‍යය වටහා දුන් හ. තවද, ආලවක යක්ෂයා ප්‍රශ්න විසඳීමෙන් දහැම් මඟට ගත්තාසේ ම කිසාගෝතමියට ප්‍රායෝගික න්‍යාය උපයෝගී කර ගත්හ. කසීභාරද්වාජ ගොවියට ගොවිකමෙන් උපමා ගෙන දහම් දෙසා වදාළ සේ ම සච්චකයාට ප්‍රශ්න විසඳීමෙන් සත්‍ය පහදා දුන් හ. මේ අයුරෙන් අදාළ සත්වයාට සත්‍යාවබෝධය සඳහා තමන් වහන්සේගේ ධර්මඥානය යොමු කළ යුත්තේ කවර ආකාරයකින් ද යන්න වටහා ගත් බුදුන් වහන්සේ එ මඟින් තම ධර්මය ඔවුනට ලබා දුන් සේක.

බුදුන් වහන්සේ අවබෝධ කර ගත්තා වූ ධර්මය උන්වහන්සේ මුල මැද අග මනා ව සකසා දේශනා කරන සේක. දේශනා කළයුතු දෙය සුදුසු කලට සකසා දේශනා කරන්නෝ ය. ඒ ධර්මය යමෙක් අනුගමනය කළ යුත්තේ බුදු දහමේ ඉගැන්වෙන විමුක්ති මාර්ගය ලඟාකර ගැනීම උදෙසා ය. මජ්ඣිම නිකායේ දී බුදුන් වහන්සේ තම ධර්මය පහුරකට උපමා කර තිබීමෙන් ඒ බව පැහැදිලි වේ.

> ''කුල්ලූපමං වො භික්ඛවෙ ධම්මං දෙසිස්සාමි. නිත්ථරනත්ථාය නො ගහනත්ථාය......''[14]

''මහණෙනි, මම තොපට පහුර උපමා කොට ඇති දහම් දෙසන්නෙමි. එය එතෙර වීම පිණිස ය. ගැනීම පිණිස නො වේ. එය අසව් මැනවින් මෙනෙහි කරව්.''

තමන් වහන්සේ අවබෝධ කරගත් ධර්මය සත්වයන්ගේ හිතසුව පිණිස දේශනා කරන බවත් එය අපේ දහම යැයි අල්ලා නො ගෙන මෙනෙහි කොට සංසාර නැමති සාගරයෙන් එතෙර වීම පිණිස පහුරක් කොට ගත යුතු බව එහි අදහස යි. මෙයින් අපට පැහැදිලි වන්නේ බුද්ධ ධර්මය වනාහී සංසාර විමුක්තිය පිණිස යොදාගත යුතු ධර්මයක් බව යි. පරම සැපය වූ නිවන් පිණිස ම ඒ ධර්මය පහුරක් කොට ගත යුතු ය.

බුදුන් වහන්සේ අවබෝධ කරගත් ඒ ධර්මයේ මහාත්මයය පිළිබඳ ව බුදුන් වහන්සේ දේශනා කරන්නේ මෙසේ ය.

> ''නො චෙ මං අනුස්සරෙය්‍යාථ අථ ධම්මං අනුස්සරෙය්‍යාථ ස්වක්ඛාතො භගවතො ධම්මො සන්දිට්ඨිකො එහිපස්සිකො ඔපනයිකො පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති. ධම්මං හි වො භික්ඛවෙ අනුස්සරතං යං භවිස්සති භයං වා ඡම්භිතත්තං වා ලොමහංසො වා සො පහීස්සති''[15]



භාවනා කිරීම සඳහා වනයට හෝ රුක් මුලකට හෝ ශූන්‍යාගාරයකට ගිය කල්හි යම් තැති ගැන්මක් ලොමු දහැ ගැන්මක් ඇති වූ කල්හි බුදු ගුණ සිහි නො කරන්නාහු නම් ධර්මයේ ගුණ සිහි කළ යුතු ය. ඒ ධර්මයේ ගුණ සිහි කරන්නේ තොට බියක් නො දෙන්නේ ය. බිය වීමක් වූයේ නම් එය බිය පහව යන්නේ යැයි බුදුන් වහන්සේ ම දේශනා කොට වදාළ සේක. එම ධර්මයේ විශේෂිත වූ ගුණ කීපයක් යට දක් වූ පාඨයෙන් ප්‍රකාශිත ය. එම ගුණ සහිත ධර්මය යමෙක් අවබෝධ කරලීම පසුබට කල් තබන්නේ නම් එතරම් මෝහ මූලික ක්‍රියාවක් නැති තරම් ය.

ඒ ධර්මයේ සුවිශේෂී භාවය ප්‍රකට කෙරෙන ගුණවාචී පද කීපයක් තත් පාඨයෙන් ධ්වනිත කෙරෙයි. එනම්,

(i) ස්වාක්ඛාත - එනම් මනා ලෙස දේශනා කරන ලද, නැත්නම් මුල, මැද, අග නිවැරැදි ව දේශනා කරන ලද අර්ථයෙනි.

(ii) සන්දිට්ඨික - මේ ජීවිතය තුළ දී ම දැකිය හැකි ධර්මය මනා ලෙස දැකීමෙන් විමුක්ති මාර්ගය එම ආත්ම භාවයේදී ම දැක ගැනීමට පුළුවන. එය වෙනත් ආත්ම භාවයක් සඳහා පහුකොට තැබිය නො හැකිය.

(iii) අකාලික - හැම කල්හි ම අවබෝධ කළ හැකි, බුදුන් වහන්සේ දේශනා කළ ධර්මය එක්තරා යුගයකට සීමා වූ ධර්මයක් නො වේ. බුදුවරුන් ලොව සිටියත් නැතත් සත්වයාගේ මෝහාන්ධකාරයෙන් වැසී තිබුණා වූ සත්‍ය ධර්මයක් බුදුන් වහන්සේ දේශනා කළ සේක. එය බුද්ධෝත්පාද කාලයකට පමණක් සීමා වූ ධර්මතාවක් නො වේ. ලෝකයේ සදාකාලික ව දක්නට ලැබෙන

පරම සත්‍යයකි. එම සත්‍යය යටිකුරු කර තිබූ බඳුනක් උඩුකුරු කර දක්වන්නා සේ බුදුවරු මනා කොට අවබෝධ කරගෙන අන්‍ය සත්වයන්ට ද පෙන්වා දෙති. එබැවින් එහි කාල නියමයක් තීරණය කළ නො හැකි ය. එය අකාලික ය.

(iv) එහිපස්සික - පැමිණ විමසා බලා අවබෝධ කර ගන්න. බුද්ධ දේශනාව කිසි විටෙකත් අන්‍යයන්ට බලහත්කාරයෙන් අවබෝධ කරවීමෙහිලා උත්සුක වූ ධර්මතාවක් නො වේ. බුදුන් වහන්සේ දේශනා කළේ තමන්ගේ දේශනාව අසා ආත්මීය ලක්ෂණවලින් තොරව ඔබගේ හදවතට මේ දේ හරි යැයි වැටහෙන්නේ නම් පමණක් පිළිගන්නා ලෙසයි. එසේ පිළිගැනීමට හැකිවන දහමක් නිසා බුදු දහම වෙත පැමිණ බලන්න යැයි නො බිය ව ප්‍රකාශ කළ හැකි ය.

(v) ඕපනයිකො - තමා තුළින් ම දක්ක යුතු ය. වෙනත් කෙනෙකුගේ දෘෂ්ටියෙන් තම විමුක්තිය ළඟා කර ගත නො හැකිය. එබැවින් තමා ම පැමිණ බලා තමා ම තීරණය කළ යුතු ය. බුදුන් වහන්සේ මග පෙන්වන්නෙක් මිසක ඒ මග එකතු කරගෙන යන්නෙක් නො වේ. එබැවින් ඒ ධර්මය තම ලෝකය වෙත යොමු කොට තමා තුළින් ම ඒ සද්ධර්මයේ සත්‍යතාව අවබෝධ කරගත යුතු ය. වෙනත් කෙනකු විමුක්තිය ලබාගත් නිසා තමාට ද එය ලැබේ යැයි සිත සිතා සිටීමෙන් ප්‍රයෝජන නැත. තමා ම ඒ ධර්මය දෙස සිත් හෙළූ අයෙකු විය යුතු ය. එය තමාගේ විමුක්තිය පිණිස හේතු වේ.



(vi) පච්චත්තං වෙදිතබ්බො විඤ්ඤූහීති - බුද්ධිමත් තැනැත්තන් විසින් ප්‍රත්‍යක්ෂයෙන් අවබෝධ කොට හැකි, බුද්ධ ධර්මය වනාහි දුශ්ප්‍රාඥයන්ට නො ව ප්‍රඥාවන්තයන් උදෙසා වූ ධර්මයකි. එහි යථාවබෝධය ලබාගත හැක්කේ යමක් පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබාගත හැකි තැනැත්තන්ට පමණි. තීරණ ගැනීමේ දී හරි වැරදි තෝරා බේරා ගැනීමේ හැකියාව මෙහි දී ප්‍රඥා යන පදයෙන් උපලක්ෂිත යි. චූල්ලපන්ථක තෙරුන් එක් ගාථාවක් කට පාඩම් කර ගන්නට සත් අවුරුද්දක් ගත කොට නො හැකිව එක ම ප්‍රායෝගික ක්‍රියාවකින් නිවන අවබෝධ කර ගත්තේ බුදු දහමෙහි ඇති මේ සාර්වාස්ථික ලක්ෂණ නිසාය.

බුදුන් වහන්සේ දේශනා කොට වදාළ ශ්‍රී සද්ධර්මයේ ඇති සුවිශේෂීතාව එය යි. මෙසේ තමා විසින් ම අවබෝධ කටයුතු වූ ධර්මයක හරය අවබෝධ කර ගතයුතු වන්නේ තමා විසින් ම ය. නො පෙනෙන ලෝකයක, නො පෙනෙන අනාගතයකට ධර්මාවබෝධය කල් දැමීම මෝහ මූලික ක්‍රියාවකි. එබැවින් ඒ උතුම් සද්ධර්මයේ ඵලය නෙළා ගැනීමට මේ අත් බැව්හි දී ම උත්සුක විය යුතු බව බුද්ධ දේශනාව යි.

චතුරාර්ය සත්‍යය මුල්කොට බුදුන් වහන්සේ විසින් පන්සාලිස් වසරක් මුළුල්ලෙහි දේශනා කරන ලද ධර්මයේ විශිෂ්ටත්වය, ගාම්භීරත්වය, නිකාය ග්‍රන්ථවලින් විවරණය කොට ඇති අයුරු ඉහත තොරතුරුවලින් අවබෝධ කර ගැනීමට පුළුවන. එම බුදු දහම හේතුඵලවාදී සිද්ධාන්තමුල්කොට විද්‍යාත්මකමෙන් තර්කානුකූල වන අතර එහි මූලික අභිලාසය සත්ව විමුක්තිය යි. බුදු දහමෙහි විශිෂ්ටතාව මෙ පමණැයි කියා නිම කිරීමට විශ්වයේ සත්වයෙකු නැත්තා සේ ම එමගින් ප්‍රයෝජන ගත නො හැකි සත්වයෙකු ද සොයා ගත නො හැකි ය. එම ධර්මය,

(i) අනුපුබ්බ සික්ඛා - ක්‍රමවත් ශික්ෂණය
(ii) අනුපුබ්බ කිරියා - ක්‍රමවත් චර්යාව
(iii) අනුපුබ්බ පටිපදා - ක්‍රමවත් ප්‍රතිපත්තිය[16]

යන අනුපිළිවෙලින් ප්‍රගුණ කිරීමෙන් පුද්ගල විමුක්තිය උදාකර ගත හැකි ය. මිනිස් මනසෙහි පමණක් නො ව සත්ව මනසෙහි ප්‍රවර්ධනය කළයුතු උතුම් සිතුවිලි කෙරෙහි ඍජුව බලපාන මෙම තථාගත ධර්මය සතුන්ගේ දෙ ලෝ සුභ සිද්ධිය පිණිස පමණක් නො ව නිර්වාණ මාර්ගයේ ඒකායන අඩිතාලම ද වන්නේය. එය මූල ග්‍රන්ථවලින් විස්තර වූ ආකාරය ඉහත තොරතුරුවලින් දැකගැනීමට පුළුවන.

පාදක සටහන්


1. අංගුත්තර නිකාය, 2. චතුක්ක නිපාත, උරුවේල වග්ග, ලෝක සුත්ත, පිටු අංක 48-49.
2. දීඝ නිකාය i, බ්‍රහ්මජාල සුත්ත, බු. ජ. මු. 1962, පිටු අංක 20.
3. සංයුක්ත නිකාය 3, ඛන්ධ සංයුක්තය, පුප්ඵ වග්ගය, පුප්ඵ සුත්ත, පිටු අංක 238-240.
4. සංයුක්ත නිකාය 3, ඛන්ධක සංයුක්තය, සීහෝපම සූත්‍රය, බු. ජ. මු. 1987, පිටු අංක 146.
5. ම. නි. 1, අරිය පරියේසන සුත්ත, පිටු අංක 414.
6. සං. නි. 3, ඛන්ධ සංයුක්ත, අන්ත වර්ගය, අරහන්ත සුත්ත, බු. ජ. මු. 1974, පිටු අංක 280-281.
7. ම. නි. 1, අරිය පරියේසන සුත්ත, පිටු අංක 414.
8. සං. නි. 5 සච්ච සංයුක්ත, ධම්මචක්කපවත්තන වර්ගය, ධම්මචක්කපවත්තන සූත්‍රය, පිටු අංක 272.
9. සං. නි. 2, අභිසමය සංයුක්තය, ගහපති වග්ග, ලෝක සූත්‍රය, බු. ජ. මු. 1974, පිටු අංක 114.
10. ඛුද්දක නිකාය 1, ධම්මපදය, බුද්ධ වර්ගය, 5 ගාථාව.
11. අං. නි. 2, චතුක්ක නිපාතය, චක්ක වර්ගය, ද්‍රෝණලෝක සූත්‍රය, පිටු අංක 77-78.
12. සුත්ත නිපාතය, ආලවක සූත්‍රය, බු. ජ. ත්‍රි. ග්‍ර. පිටු අංක 06.
13. දීඝ නිකාය සසස, පාථික වග්ග, සංගීති සුත්ත, පිටු අංක 386, බු. ජ. ත්‍රි. ග්‍ර. 1976.
14. මජ්ඣිම නිකාය , ඔපම්ම වග්ගය, අලගද්දූපම සූත්‍රය, පිටු අංක 336.
15. සංයුක්ත නිකාය i, සුචිර වර්ගය, ධජග්ග සූත්‍රය, පිටු අංක 390.
16. ම. නි. iii, ගණකමොග්ගල්ලායන සූත්‍රය, බු. ජ. ත්‍රි. ග්‍ර. 1974, පිටු අංක 90, අනුරාධපුර.